**www.wsws.org**

**ලෝක සමාජවාදී වෙබ් අඩවිය**

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මාක්ස්වාදය, ජාත්‍යන්තර කමිටුව සහ ඉදිරිදර්ශනයේ විද්‍යාව: ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අර්බුදය පිලිබඳ ඓතිහාසික විශ්ලේෂනයක්

**Marxism, the International Committee, and the science of perspective: an historical analysis of the crisis of American imperialism**

**දෙවන කොටස**

**ඩේවිඩ් නෝර්ත් විසිනි**
**2005 ජනවාරි 12**

ජනවාරි 8-9 සති අන්තයේ දී සමාජවාදී සමානතා පක්ෂය මිචිගන් ප්‍රාන්තයේ ඈන් ආබර් නගරයේ දී සිය ජාතික සාමාජිකත්වයේ රැස්වීමක් පැවැත්විය. ආරම්භක වාර්තාව ඉදිරිපත් කරන ලද්දේ සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් හා *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සභාපති ඩේවිඩ් නෝර්ත් විසිනි. මෙම වාර්තාව කොටස් තුනකින් පල කෙරේ. (යට දැක්වෙන්නේ දෙවන කොටස ය. තෙවැනි කොටස හෙට දින පල කෙරෙනු ඇත. ප්‍රථම කොටස පල කරන ලද්දේ ජනවාරි 11 දින ය.)

හරියටම මීට අවුරුදු 20කට පෙර මෙම සතියේ දී, 1985 ජනවාරියේ දී හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (ජා.ක.) විවිධ ශාඛාවල නියෝජිතයෝ ජාත්‍යන්තර කමිටුවේ 10 වන සම්මේලනයට සහභාගි වීම සඳහා එංගලන්තයට ගමන් කලහ. එය වනාහී ජෙරී හීලි, ක්ලිෆ් ස්ලෝටර් සහ මයිකල් බන්ඩා විසින් නායකත්වය දෙන ලද බ්‍රිතාන්‍ය කම්කරු විප්ලවවාදී පක්ෂය (කවිප) මුල’සුන සිට පවත්වන ලද අවසාන ජාත්‍යන්තර සම්මේලනය යි.

ඒ වන විටත්, දශකයකට වැඩි කාලයක් තිස්සේ ජාත්‍යන්තර ව්‍යාපාරය තුල දේශපාලන අර්බුදයක් වැඩෙමින් පැවැතී තිබුනි. කලින් අවුරුදු තුන තුල දී ජාත්‍යන්තර කමිටුව තුල සාවද්‍ය දාර්ශනික ස්ථාවරයක් ද දේශපාලන පිලිවෙතේ බරපතල වැරදි ද සාකච්ඡා කර පරීක්ෂා කිරීමට දැරුනු ප්‍රයත්නයක් කවිප නායකත්වය විසින් යටපත් කර දමන ලදී. එම තතු තුල 1985 දී ජාත්‍යන්තර කමිටුව රැස්වන විටත්, මුලු ලෝක ව්‍යාපාරය ම භයානක ලෙස නොමග යවනු ලැබ තිබුනි. අන් සියලු ශාඛාවන්ට වඩා නරක තත්වයකට පත්ව තිබුනේ කවිපය යි. ක්ලිෆ් ස්ලෝටර් තමා විසින් සකස් කරනු ලැබූ කෙටුම්පත් දේශපාලන ඉදිරිදර්ශන යෝජනාවේ දේශපාලන පුහු බව වාචාල මැත දෙඩවීමකින් වසං කර ගැනීමට උත්සාහ දරා තිබුනි. එම යෝජනාවේ මුලු ස්වභාවයට ම උදාහරන වූ එක් ඡේදයක් මෙසේ නිවේදනය කලේ ය: ‘‘දැන් ඉතින් ධනේශ්වර පරිහානියේ වෛෂයික නීති බාධාවකින් තොරව ක්‍රියාත්මක වේ. ඒවා රෑන් කඩාගෙන ඉදිරියට යයි.’’ මෙය සත්‍ය නම්, ඉන් අදහස් වනු ඇත්තේ ධනේශ්වර ක්‍රමයේ ඉතිහාසය තුල පෙර නුවූ විරූ තත්වයක් පැනනැග තිබුනා විය යුතු ය; එපමනක් නොව, එම තත්වය මාක්ස් විසින් ම සැලකෙනු ඇත්තේ න්‍යායිකව සහ ප්‍රායෝගිකව නො සිදුවිය හැක්කක් ලෙස ය.

ධනේශ්වර පරිහානියේ නියාමයන් ‘‘බාධාවකින් තොරව’’ ක්‍රියාත්මක වී ඇතැයි යන්නට තිබිය හැක්කේ පහත සඳහන් අර්ථය පමනි.

1. මෙම පරිහානියට ධනේශ්වරයේ පැත්තෙන් දැක්විය හැකි සකල ආත්මීය ප්‍රතිරෝධයක් ම අවසානයට පත්ව තිබුනි.

2. මෙවන් පරිහානියක් මුලුමනින් ම ආපසු හැරවීමට, නැතිනම්, අඩුගනනේ සමනය කර දැමීමට ධනේශ්වර සන්තතිය තුලින් ම ස්වභාවිකව පැන නගින්නාවූ ප්‍රතිහාරක ප්‍රවනතාවයන් මුලුමනින් ම අකර්මන්‍ය වී ඇත. වෙනත් වචනවලින් කිව හොත් ලෝක ඓතිහාසික පද්ධතියක් හැටියට ධනේශ්වරයේ සමාජ ආර්ථික අපෝහකය සරලවම ඇනහිට තිබින.

කෙටුම්පත් ලියවිල්ලේ තවත් ඡේදයක් ‘‘යථාර්ථය නම් තීරනාත්මක විප්ලවවාදී සටන් දැනටම අරඹනු ලැබ ඇති බව ය’’යි කියා සිටියේ ය. ක්ලිෆ් ස්ලෝටර්ගේ උල්පත් පැනෙන් මෙම වචන ගලා එන විටත්, ලෝකය පුරාම කම්කරු පන්තිය පසු බැසීමකට ලක්ව පැවති බවක් අඟවන්නා වූ නොවරදින ලක්ෂන පහලව තිබුනි. ඔවුන් කී ආකාර ‘‘තීරනාත්මක විප්ලවවාදී සටන් ඒ වනවිටත් ඇරඹී ඇතැ’’යි යන්න සත්‍ය වී නම්, ‘‘ඒ වන විටත් ඒවා පරාජයට පත්ව තිබුනි ය’’යි ද නිගමනය කිරීමට සිදුවනු ඇත. තමාගේම මැත දෙඩවීම්වලින්

මන්මත් වූ ස්ලෝටර් ඒ මෙසේ ද ප්‍රකාශ කර සිටියේ යත ''ඇමරිකා එක්සත් ජනපදයේ කම්කරු පන්තිය අපරාජිතව සිටී; එය ලෝකයේ වෙනත් රටවල කම්කරු පන්තිය සමග එකවරම විප්ලවවාදී අරගලවලට ඇතුලුවෙමින් සිටී.'' මීට ප්‍රතිවිරුද්ධව ඇත්ත වසයෙන් ම, සිදුව තිබුනේ අවුරුදු 4කට පෙර රීගන් ධවල මන්දිරයට පිවිසුනු තැන් පටන් කම්කරු පන්තිය ප්‍රමුඛ පරාජයන් ගනනාවකට නොකඩවාම පාත්‍ර වී තිබීම ය. ස්ට්‍රයික් අරගල පාවා දෙනු ලැබ, අධෛර්යමත්ව දශකයක කාලයට ඉතාම අඩු මට්ටමකට ඇද වැටී තිබුනි. විප්ලවවාදී ඉදිරිදර්ශනයන් විස්තාරනය කිරීමට ප්‍රතිපදානයක් ය යි කියමින් ඉහත වන් ඡේද ඉදිරිපත් කිරීමට හැකි වීම ම කව්පප නායකයන්ගේ න්‍යායික මංමුලාවට, දේශපාලන බංකොලොත්බවට, දෙස් දුනි.

කම්කරු විප්ලවවාදී පක්ෂයේ නායකයන් ගේ විශේෂයෙන්ම ජෙරී හීලිගේ අත්‍යසාමාන්‍ය දේශපාලන ඉතිහාසය සැලකිල්ලට ගත් කල්හි, ඔවුන් දැන් එලඹ තිබුනේ අතිශයින්ම ශෝචනීය තත්වයකට ය. පෞද්ගලිකව හීලි විප්ලවවාදී සමාජවාදී ව්‍යාපාරයට සහභාගි වී අඩ සිය වසකට අධික කාලයක් ගත වී තිබුනි. 1953 දී ජාත්‍යන්තර කමිටුව පිහිටුවා ලීමට මග පෑදූ, පැබ්ලෝවාදී සංශෝධනවාදයට එරෙහි ජාත්‍යන්තර අරගලයේ දී හීලි ජේම්ස් පී. කැනන්ගේ ආධාරකරුවෙකු ලෙස වැදගත් ක්‍රියා කලාපයක් ඉටු කර තිබුනි. ඊලග දශකය තුල දී, හෙතෙම ඇමරිකානු එක්සත් ජනපදයේ සමාජවාදී කම්කරු පක්ෂයේ (සකප) න්‍යායික සහ දේශපාලන පසස ගැහීමට එරෙහි වී සටන්වැද එම පක්ෂය පැබ්ලෝවාදී ව්‍යාපාරය සමග ප්‍රතිපත්ති විරහිත ලෙස යලිත් එක්සත් වීමට සකසමින් තිබුනු සැලසුම්වලට විරුද්ධ විය. අතිශයින්ම අවාසි සහගත දේශපාලන තතු තුල ජාත්‍යන්තර කමිටුව රැකී පැවැත්ම ම බෙහෝ දුරට රඳා පැවැත්තේ හීලි විසින් අප්‍රතිහතව ට්‍රොට්ස්කිවාදී මූලධර්ම ආරක්ෂා කිරීම මත ය. ඔහු විසින් නායකත්වය දෙන ලද අරගලය නො වී නම් (සමාජවාදී සමානතා පක්ෂයේ පෙර ගමන්කරු වූ) වර්කර්ස් ලීගය කවර කලෙකවත් පැනනොනගිනු ඇත.

එපමනක් නොවේ, විශේෂයෙන්ම 1963දී - සමාජවාදී කම්කරු පක්ෂය සමග භේදයෙන් ඉක්බිත්තේ - හීලි ලෝක ධනවාදය තුල වැඩෙමින් ආ ආර්ථික අර්බුදයේ ලකුනුවලට සුපරීක්ෂ අවධානයක් දුන්නේ ය. පශ්චාත් දෙවන ලෝක යුද්ධ ධනවාදයේ ස්ථාවරත්වය ගැන තමන්ට තිබුනු විශ්වාසය තම පිලිවෙත් මගින් පිලිබිඹු කල පැබ්ලෝවාදීන්ට විසදෘශව, ජාත්‍යන්තර කමිටුව දෙවන ලෝක යුද්ධය අවසානයේ දී පිහිටුවන ලද්දා වූ ලෝක ධනවාදයේ රාජ්‍ය මූල්‍ය සම්පාදක හා මුදල්මය අත්තිවාරම් බරපතල ආතතියකට පත්වෙමින් පැවතුන බවට පැන නැගී තිබුනු ලක්ෂන ඉතා සමීපව අධ්‍යයනය කලේ ය. එහෙයින්ම, නික්සන් පාලනාධිකාරය විසින් පශ්චාත් දෙවන ලෝක යුද්ධ ''ස්වර්නමය යුගය'' හදිසි අවසානයකට ගෙන එමින් 1971දී ගත් තීන්දුවල දූරගාමී ආර්ථික හා දේශපාලන ගම්‍යයන් වටහා ගැනීමට හැකි තත්වයක ජාත්‍යන්තර කමිටුව සිටියේ ය.

1971 අගෝස්තු 15 දා ඉරුදින සැන්දෑවේ ජාතික රූපවාහිනී සේවය ඇමතූ ජනාධිපති රිචඩ් එම්. නික්සන් එක්සත් ජනපදය පිරිහී යන ජාත්‍යන්තර වෙලඳ හා ගෙවුම් ශේෂ තත්වයට ද වැඩෙන උද්ධමනකාරී පීඩනයට ද ප්‍රතිචාර ලෙස ගනු ලබන ආර්ථික පියවර මාලාවක් නිවේදනය කලේ ය. 1944 ජුලි මස බ්‍රෙට්න්වුඩ්ස්හි දී පැවැත්වුනු සම්මේලනයෙන් ඉක්බිති පිහිටුවන ලද ජාත්‍යන්තර මූල්‍ය පද්ධතියේ නීති රීති අනුව සිය වෙලඳ සහකරු රාජ්‍ය ඉල්ලා සිටියොත් ඩොලර්වලට රත්රන් හුවමාරු කිරීමට එක්සත් ජනපදය කර තිබූ සපථයට එරට තව දුරටත් බැඳී නොසිටින බව ඔහු දැනුම් දුනි. මෙම සිද්ධිය පැබ්ලෝවාදීන් විසින් බොහෝ සෙයින් නොතකා හරින ලදී. එහෙත් ජාත්‍යන්තර කමිටුවට මෙය දෙවන ලෝක යුද්ධයෙන් පසුව සිදු වූ අර්ථභාරී ම ආර්ථික සිද්ධිය වූයේ ය. මෙය ලෝක ආර්ථික අර්බුදය ගැඹුරු කොට ජාත්‍යන්තර පන්ති අරගලය උග්‍ර කරන බව ද ජාත්‍යන්තර කමිටුව වටහා ගත්තේ ය. මෙම අර්බුදයේ හදවතෙහි ම පැවැත්තේ ඇමරිකානු ධනවාදයේ ලෝක තත්වය පිරිහී යාම ය.

මෙම වර්ධනය විශ්ලේෂනය කිරීමේ දී ජාත්‍යන්තර කමිටුව දෙවන ලෝක යුද්ධය අවසන් සමයේ 1944 බ්‍රෙට්න්වුඩ්ස්හි දී අත්තිවාරම් දැමුනු ජාත්‍යන්තර ආර්ථික පද්ධතියේ අර්ථභාරය යලිත් විමර්ශනය කලේ ය. එකල්හි, යුරෝපයේ පැරනි ධනේශ්වර රාජ්‍ය නටබුන්ව පැවතුනි. ප්‍රන්ස ධනපති පන්තිය දේශපාලනිකව කීර්ති හංගත්වයට පත්ව තිබුනු අතර එහි මූල්‍ය පද්ධතිය කුඩුවී ගොස් තිබුනි. හිට්ලර් පාලනය ජර්මන් ධනවාදය පාතාලයට ඇද දමා තිබුනි. මුලු ජර්මනියම පැවතියේ ගිනිගෙන දැවෙමිනි. පලමුවන ලෝක යුද්ධයෙන් අවුරුදු 20ක් ගතවීමටත් පෙරාතුව දෙවන ලෝක යුද්ධයක වියදමට කර ගැසීමට සිදු වී තිබුනු බ්‍රිතාන්‍යය බංකොලොත්ව තිබුනි. යුරෝපය පුරා කම්කරු පන්තිය ෆැසිස්ට්වාදයට සහ අධිරාජ්‍යවාදී ම්ලේච්ඡත්වයට එරෙහිව ප්‍රහාරාත්මකව ඉදිරියට පැමින තිබුනි. ධනවාදය සමග විප්ලවවාදී ලෙස ගනුදෙනු බේරාගැනීම සඳහා වූ අතිමහත් ජනතා හැඟීම් ඉහවහ ගියේ ය. යුද්ධය භයංකර සමාප්තියක් කරා ගමන් කරමින් තිබුනු ජපානයේ ද එවන් තත්වයක් පැවතියේ ආසියාව, මැදපෙරදිග සහ අප්‍රිකාව පුරා අධිරාජ්‍ය විරෝධී සහ යටත් විජිත විරෝධී අරගල ඇවිල ගියේ ය.

යුද්ධයේ ව්‍යසනය මැද්දැවේ, එක්සත් ජනපදය ධනවාදයේ මහා බල කඳවුර ලෙස මතු විය. යුද්ධය එහි සියලුම ජාත්‍යන්තර ධනේශ්වර තරගකරුවන් කුඩු පට්ටම් කර දමා තුබුනි. යුද්ධයේ හලු වලින් පැන නගින්නට යන ලෝක ආර්ථික පර්යායේ කොන්දේසි කුමක් විය යුතු දැයි ඇදවැටී සිටි තම ප්‍රතිමල්ලවයන්ට අනපැනවීමට හැකි තත්වයක් එක්සත් ජනපදයට

අත්පත්වී තිබුනි. එහෙත් සිය පන ම රැකෙනු ඇත්තේ යුරෝපය තුල ධනවාදය රැකී ගත්තොත් පමනක් බව ඇමරිකානු පාලක පන්තිය කෙසේ වුවද වටහා ගෙන තිබුනි. පශ්චාත් යුද්ධ විප්ලවවාදී රැල්ල යුරෝපා මහාද්වීපය හරහා හඹා ගියහොත්, ධනවාදයේ පැරනි මධ්‍යස්ථානවල කම්කරු පන්ති බලය පිහිටුවාලුවහොත් තනිවන ඇමරිකානු ධනවාදයේ අවසාන ඉරනම තීන්දු වූවා වනු ඇත. එහෙයින් දුර දක්නා තීන්දු මාලාවක් ගත් ඇමරිකානු පාලක පන්තිය තම ඉමහත් කාර්මික හා මූල්‍ය සම්පත් ලෝක ධනේශ්වර පද්ධතිය ස්ථාවර කොට යලි ගොඩ නැගීම සඳහා බලමුලු ගන්වා ගැනීමට තීන්දු කලේ ය. අවපාතය සහ යුද්ධයේ දශකයකට පසුව ඇතිව තිබුනු කඩා කප්පල් වීමෙන් ඉක්බිතිව ලෝක වෙලඳාම යලි ස්ථාපනය කිරීම සඳහා ද, යුරෝපය සහ ජපානය යලි ගොඩනගාලීම සඳහා ද අවශ්‍ය සම්පත් සම්පාදනය කිරීමට ජාත්‍යන්තර මූල්‍ය පද්ධතියක් නිර්මානය කිරීම මේ ආර්ථික සැලැස්මේ අත්තිවාරම විය.

පලමුවන ලෝක යුද්ධයෙන් ඉක්බිත්තේ පැන නැගි මූල්‍ය ව්‍යසන ඇමරිකා එක්සත් ජනපද පාලනාධිකාරයට ඒත්තුගන්වා තිබුනේ නය සම්පාදනය සීමා කිරීමට තුඩු දුන්නා වූ පැරනි රන් මිනුම් තන්ත්‍රය සමග ලෝක ධනවාදය යලි ගොඩනැගීම සමහන් කල නොහැකි බව ය. එහෙත් නය සම්පාදනයේ ද ලෝක වෙලඳාමේ ද ප්‍රාථමික උපකරනය ලෙස මෙතෙක් රත්රන් ගෙන තිබුනු තැන ගෙන ක්‍රියා කල හැක්කේ කුමකට ද? මෙම ප්‍රශ්නයට තිබුනු සරල උත්තරය නම් ''එක්සත් ජනපද ඩොලරය ය'' යන්න යි.

1947 අලුතෙන් පිහිටුවා තිබුනු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නීති යටතේ, එක්සත් ජනපද ඩොලරය ලෝකයේ ප්‍රධාන සංචිත මූල්‍යය (එනම් ජාත්‍යන්තර වෙලඳාමේ අතිමහත් පංගුව සඳහා ගනුදෙනු කරනු ලබන මුදල) ලෙස සේවය කරනු ඇතැයි නියම විය අන් සියලු ජාත්‍යන්තර මුදල් වර්ග ඩොලර් වලින් මිල කරනු ඇත. ඩොලරයම ගතහොත් එහි අගය රත්රන්වලින් නිර්නය කෙරෙනු ඇත. නිශ්චිත වසයෙන්ම කීවොත් රත්රන් අවුන්සයකට ඩොලර් 35 යනුවෙන් සමනුපාත කෙරෙනු ඇත.

මෙම සැලැස්ම වැදගත් කරුනු දෙකක් මත පදනම් විය. ප්‍රථමව, ලෝකයේ රන්වලින් සැලකියයුතු කොටසක් ඇමරිකාවේ කෙන්ටකී ප්‍රාන්තයේ ෆෝර්ට් නොක්ස්හි ගොඩගැසී තිබුනි. දෙවනුව සහ වඩාත් වැදගත්වන දෙවන ලෝක යුද්ධයෙන් පසුව එක්සත් ජනපදය දිනාගත් යෝධ ආර්ථික ආධිපත්‍යය මගින් එරටට අති මහත් වෙලඳ ශේෂය අතිරික්තයන් අත් කරදෙනු ඇතැයි සහතික කැරිනි. ඇමරිකාවෙන් පිටත්තර ආයෝජිත හෝ අපනීත ඩොලර් විදේශීය රටවල් විසින් ඇමරිකානු භාන්ඩ හා සේවා මිලදී ගැනීම මගින් යථාකාලයේ දී ආපසු ඇමරිකාවට ම ගලා එනු ඇතැයි සැලැකිනි.

මේ අනුව රන්වලට ගැට ගැසූ ඩොලර්වලින් පදනම දැමුනු පශ්චාත් යුදකාලීන මූල්‍ය පද්ධතිය ලෝක ධනවාදයේ කටයුතුවල දී ඇමරිකා එක්සත් ජනපදයේ ආධිපත්‍යයේ ප්‍රකාශනයක් විය. ඇමරිකානු ආධිපත්‍යයේ යුගයක් ගැන කෙනෙකුට කතා කල හැකි වී නම් ඒ වනාහී ඩොලරය මත පිහිටුවන ලද බ්‍රෙට්න්වුඩ්ස් ලෝක මූල්‍ය පද්ධතියේ ක්‍රියාකාරිත්වය මගින් නිර්වචිත සමය ය.

එසේ වුවද බ්‍රෙට්න්වුඩ්ස් පද්ධතිය තමන් තුලම මාරක ප්‍රතිසතිතාවක් ගැබ් කර ගති. මෙම පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක වීමට නම් එක්සත් ජනපදය විසින් යුරෝපයට සහ ජපානයට කර්මාන්ත යලි ගොඩනගාගැනීම සඳහා ප්‍රාග්ධනය සපයන ගමන්ම, තම රට තුල විදේශීය අපනයන සඳහා වෙලඳපොලක් සපයන ගමන්ම, තමාගේ වෙලඳ හා ගෙවුම් ශේෂ ගිනුම්වල සාධනීය ලෙජරයක් පවත්වා ගැනීමට ද සමත් වීම අවශ්‍ය විය. එහෙත් යුරෝපීය සහ ජපන් කර්මාන්ත යලි පන ගැන්වීම ලෝක වෙලඳපල තුල එක්සත් ජනපදයේ කලෙක අනභියෝගී වූ ආධිපත්‍යයට යටින් වල කැපීමට හේතු විය. එම තත්වය වෙලඳාම සහ ගෙවුම්ශේෂ හිගයන්ට නොවැලැක්විය හැකි ලෙස බලපෑවේ ය. මෙමගින් ඇමරිකාව අත පැවති රත්රන් ප්‍රමානය බෙහෙවින් ඉක්මවමින් විදේශයන් අත ඩොලර් ඒකරාශීවීම කල්යාමේ දී බ්‍රෙට්න්වුඩ්ස් පද්ධතියේ ශක්‍යතාවය ප්‍රශ්නයට භාජන කරනු ඇත. රොබට් ට්‍රිෆින් නමැති යුරෝපීය අර්ථශාස්ත්‍රඥයා 1950 ගනන්වල අග දී මෙම ප්‍රතිසතිතාවට අවධානය යොමු කලේ ය. 1960 ගනන් මැද වන විට පද්ධතිය මත පැවැති පීඩනයන් වඩවඩාත් උග්‍රවනු ඇති බව පැහැදිලි වන්නට විය. වියට්නාමයේ යුද්ධයට කරන ලද වියදම ද මහා ජන අරගල වලට මුහුන දුන් ඇමරිකානු පාලක පන්තිය නව සමාජ වැඩපිලිවෙලවලට මුදල් සම්පාදනය කිරීම ද නිසා එක්සත් ජනපද අයවැය ලේඛනය මත වැඩි වූ මූල්‍ය පීඩනය තව දුරටත් බ්‍රෙට්න්වුඩ්ස් පද්ධතිය තෙරපා සිටියේ ය.

ජාත්‍යන්තර කමිටුව අපේක්ෂා කල පරිදි බ්‍රෙට්න්වුඩ්ස් පද්ධතියේ බිඳ වැටීම දුර දිග යන ආර්ථික හා දේශපාලන විපාක ජනනය කලේ ය. 1930 ගනන් වලින් පසුව දක්නට නොලැබුනු මට්ටමකට ජාත්‍යන්තර ආර්ථික සබඳතාවෝ අස්ථායීකරනය වූහ. ස්ථාවර හුවමාරු අනුපාත සහිත පැරනි පර්යාය පාවෙන මුදල් මත පදනම්වූ අනුමාන පර්යායකට ඉඩදී අයින් විය. සෑම ජාතික මුදලකම අගය තීන්දු කිරීම දැන් ඉතින් වෙලඳපොලට බාර විය. නිශ්චිත මිලකට රත්රන් වලට හුවමාරු කිරීමට ඉඩක් තව දුරටත් නොලත් ඩොලර් මුදල දිග්ගැසුනු පරිහානි ක්‍රියාවලියකට ඇද වැටුනි. ඩොලරයේ අගය බාල්දු වී යාම වහාම ලෝක පරිමාන මිල උද්ධමනයකට ද කොටස් වෙලඳපොලවල් තුල කොටස් මිල බිඳ වැටීමකට ද දොර හැර දුනි. 1973 වන විට, ලෝක ධනවාදය 1930 ගනන්වලින් මොබ ඇති වූ අතිශයින්ම භයානක ඒකාබද්ධ දේශපාලන ආර්ථික අර්බුදයන්ට මුහුන දුනි.

මෙම වර්ධනයෙන් ලෝක ධනවාදයේ භූගෝල පරිමාන අර්බුදය පිළිබඳව ජාත්‍යන්තර කමිටුව කර තිබුනු විශ්ලේශනය තහවුරු කර ලන ලදී. 1970 ගනන් කම්කරු පන්තිය විප්ලවවාදී නැගිටීමක් අත්දුටු දශකයක් විය. උද්ධමනයට එරෙහි ප්‍රහාරයකට කම්කරු පන්තිය ඉදිරිපත් විය. 1973-74 බ්‍රිතාන්‍ය පතල් කම්කරු වැඩවර්ජනය ටෝරි ආන්ඩුවට ඉල්ලා අස්වීමට සිදු කලේ ය. 1974 අප්‍රේල් මාසයේ දී පෘතුගාලයේ ෆැසිස්ට් ඒකාධිපතිත්වය ද ඉක්බිති ජුලි මාසයේ දී ග්‍රීසියේ ජෙනරාල් පැපඩොපවුලස්ගේ මිලිටරි පාලනයද බිඳවැටුනි. ඉන් මාසයකට පසුව 1974 අගෝස්තුවේ දී රිචර්ඩ් නික්සන් ජනාධිපති ධුරයෙන් ඉල්ලා අස් වුනි. ඉන් අවුරුද්දකට අඩු කාලයක් තුල 1975 අප්‍රේල්-මැයි මාසවල දී වියට්නාමයේ හා කාම්බෝජයේ අධිරාජ්‍යවාදී යුද්ධය දීන පරාජයකින් අවසන් විය.

එහෙත් මෙම විප්ලවවාදී රැල්ල ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරයේ ස්ටැලින්වාදී හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී නිලධාරීන්ගේ පිලිවෙත් විසින් මොටකර දමනු ලැබුනි. 1978 තෙල් කම්කරුවන්ගේ ස්ට්‍රයික් අරගල (1953 දී සීඅයිඒ විසින් යලි බලයේ පිහිටුවා තිබුනු) ෂා රජුගේ පාලනය කොර කර දැමීම සඳහා තීරනාත්මක ලෙස හේතු වූ තතු තුල ද ඉරාන ස්ටැලින්වාදී පිලිවෙත් සමාජවාදී විප්ලවයක ජයග්‍රහනය වලකාලී ය. ඒ වෙනුවට ආගමික හා ජාතිකවාදී බලවේග අතට එරට බලය පත්විය. කම්කරු පන්ති අරගල මෙසේ පාවාදීම අධිරාජ්‍යවාදයට තමන්ගේ ම ප්‍රතිවිප්ලවවාදී මූලෝපාය සකසා ක්‍රියාත්මක කොට කම්කරු පන්තියට එරෙහි ප්‍රතිප්‍රහාරයට පැන ගැනීමට අවශ්‍ය කාලය ලබා දුනි.

දේශපාලන වඩදිය බැස යත්ම තත්වය පිලිබඳ අලුත් තක්සේරුවක් කර තම භාවිතයේ අවශ්‍ය නව වෙනස්කම් ඇති කර ගැනීමට බ්‍රිතාන්‍ය කම්කරු විප්ලවවාදී පක්ෂය අසමත් විය; ක්ලිෆ් ස්ලෝටර් ජාත්‍යන්තර කමිටුවේ ශාඛාවන්ට නිතරම අනතුරු හඟවා තිබුනේ, ''ඔබගේ ඉදිරිදර්ශනයන් සනාථවූ කල්හි, එය යලිත් පරීක්ෂා කර ගත යුතු ය'' කියා ය. එහෙත් කව්පය තමන්ගේ ම අවවාද අනුගමනය කිරීමට අසමත් විය; සිය භාවිතය වෙනස්වූ දේශපාලන තත්වයට අනුකූල කර ගැනීමට අසමත් විය. සමාජවාදී විප්ලවයක් ඉක්මනින් ඇතිවීමේ ඉඩකඩ තුනී වී යත්ම කම්කරු විප්ලවවාදී පක්ෂය තම සංවිධානාත්මක ගැම්ම නඩත්තු කිරීම බ්‍රිතාන්‍ය කම්කරු නිලධරයේ කොටස් ද මැද පෙරදිග හා අප්‍රිකාවේ ධනේශ්වර ජාතිකවාදී ව්‍යාපාර ද සමග නව හා අවස්ථාවාදී සබඳතා මත පදනම් කර ගැනීමට යත්න දැරුවේ ය. සංශෝධනවාදයට එරෙහි ජාත්‍යන්තර කමිටුවේ දීර්ඝ අරගලයට පසුපස හැරවූ කව්පය පැබ්ලෝවාදීන්ගේ දේශපාලන පිලිවෙතට එන්න එන්නම වැඩි වැඩියෙන් සමාන වූ දේශපාලන පිලිවෙතක් සකසා ගත්තේ ය. එපමනක් නොව, කව්පයේ සංවිධානාත්මක අවශ්‍යතා යයි හීලි විසින් දැක ගන්නා ලද දේ පිලිබඳ ඒක පාක්ෂික ග්‍රස්තියක් තුලින්, බ්‍රිතාන්‍ය ශාඛාවේ පිලිවෙත එන්න එන්නම් උග්‍රවන ජාතිකවාදී උපනතියක් අත් කර ගති. ජාත්‍යන්තර පක්ෂයක් ලෙස ජාත්‍යන්තර කමිටුවේ වැඩ කටයුතු වඩ වඩාත් කම්කරු විප්ලවවාදී පක්ෂයේ ''පක්ෂය ගොඩනැගීමේ'' ක්‍රියාකාරිත්වයට යටත් කරන ලදී.

1985 ගිම්හානයේ සහ හේමන්තයේ කව්පය තුල පුපුරාගිය අර්බුදය වනාහි එම පක්ෂය ට්‍රොට්ස්කිවාදී මූලධර්මවලින් පසුබැසීම හා එම පාවාදීමේ විපාක වසයෙන් නිවැරදි දේශපාලන දිශා'වනතියකින් පසු බැසීමේ ප්‍රතිඵලයක් විය. කම්කරු විප්ලවවාදී පක්ෂය අතහැර ජාත්‍යන්තර කමිටුවේ තම සහෝදරවරුන් සහ සම චින්තකයන් සමග සහෝදර සම්බන්ධකම්වලට වඩා කම්කරු නිලධරයන් ද, ධනේශ්වර ජාතිකවාදීන් හා සුලු ධනේශ්වර රැඩිකලුන් ද සමග විවිධ සන්ධානයන් අගයකිරීමට පටන් ගෙන තිබුනි. 1985 හේමන්තයේ දී තමන්ගේම විනාශකාරී පිලිවෙත් විසින් සිදු කරන ලද මහා විනාශය මැද හිඳගෙන සිටින අතර ම, කව්ප සාමාජිකයෝ විවිධ ප්‍රති-ට්‍රොට්ස්කිවාදී ප්‍රවනතා සමග තමන් අත් කර ගත් සම්බන්ධකම් ගැන නිර්ලජ්ජිතව පුරසාරම් දෙඩූහ. ක්ලිෆ් ස්ලෝටර් ලන්ඩනයේ පැවති රැස්වීමක දී, බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂයේ ඉතාම නම ගිය අප්‍රියජනක නියෝජිතයෙකු වූ මොන්ටි ජොන්ස්ටන්ට විලිලජ්ජා නැති උඩගුවකින් අතට අත දුන්නේ ය.

මෙම ක්‍රියාවලියට යටින් පැවැත්තේ ජාත්‍යන්තර දේශපාලන තත්වය පිලිබඳ මුලුමනින් ම සාවද්‍යවූ තක්සේරුවකි. දැන් තමන් විසින් සෙවුනා ලද විවිධ ජාතික ප්‍රතිසංස්කරනවාදී සහ අවස්ථාවාදී සංවිධානයන් ම විනාශාභිමුඛව පැවති බව කව්පයේ කුමන නායකයෙකුට හෝ හැඟී ගියේ වත් නැත. ජාත්‍යන්තර ඉදිරිදර්ශනයන් පිලිබඳව ක්‍රමානුකූල හා බරපතල විශ්ලේෂනයක් මුලුමනින්ම අත හැර දැමූ කව්පය ලෝක ධනේශ්වර ආර්ථිකයේ නව වර්ධනයන් ජාත්‍යන්තර පන්ති අරගලය කෙරේ කෙසේ බලපානු ඇත් දැයි සලකාබලනු තබා එම වර්ධනයන් මොනවා දැයි දැන හඳුනාගැනීම පවා ප්‍රතික්ෂේප කලේ ය.

1986 පෙබරවාරි මාසයේ දී කම්කරු විප්ලවවාදී පක්ෂයෙන් බිඳී වෙන්වීමෙන් ඉක්බිත්තේ ජාත්‍යන්තර කමිටුව තීරනාත්මක හා අන්තර් සම්බන්ධිත න්‍යායික කර්තව්‍යයන් දෙකකට මුහුන දුන්නේ ය. පලමුවැන්න වූයේ කම්කරු විප්ලවවාදී පක්ෂය විසින් ට්‍රොට්ස්කිවාදය පාවා දීමේ මූලයන් පිලිබඳව සවිස්තරව විශ්ලේෂනය කොට එය විසින් ජාත්‍යන්තර කමිටු වේ ඉතිහාසයට එල්ල කරන ලද ප්‍රහාරයට පිලිතුරු දීම ය. දෙවැන්න වූයේ කව්ප විසින් අත හැර දමනු ලැබූ තීරනාත්මක ඉදිරිදර්ශන වැඩ යලි ආරම්භ කිරීම ය. කව්ප පිලිබඳ විවේචනය ද හතර වන ජාත්‍යන්තරයේ ඉතිහාසය පිලිබඳ නව තක්සේරුවක් ද ජාත්‍යන්තර කමිටුව ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ඓතිහාසික උරුමය සමග, 1923 වාමාංශික විරුද්ධ පක්ෂය ආරම්භ කිරීම දක්වා සම්පූර්ණ අතීතය සම්බන්ධව දැනුවත් සම්බන්ධතාවයක්

© www.wsws.org

පිහිටුවා ගැනීම හැකි කලේ ය. ඒ සමගම ජාත්‍යන්තර ඉදිරිදර්ශනයන් පිලිබඳ ක්‍රමානුකූල වැඩ කටයුතු යලි ඇරඹීම ලෙස ධනවාදී ආර්ථික වර්ධනයේ සැබෑ වෛශයික ප්‍රවනතාවන් සමග ජාත්‍යන්තර කමිටුව වැඩ කටයුතු යලි අනුකූල කර ගැනීම සඳහා අවශ්‍ය විය.

1987 පවත්වන ලද ජාත්‍යන්තර කමිටුවේ සිව්වන පුන්සැසියේ දී පහත සඳහන් ප්‍රශ්නය මතු කරන ලදී, හතරවන ජාත්‍යන්තරය ලෝක ධනේශ්වර ආර්ථිකයේ සහ ජාත්‍යන්තර පන්ති අරගලයේ කුමන ප්‍රවනතාවයන්ගේ ආවශ්‍යක ප්‍රකාශනයක් වන්නේ ද? ඓතිහාසිකව සලකා බලන කල්හි, ධනවාදයේ නිෂ්පාදන බලවේගවල ලෝක පරිමාන වර්ධනය හා සමාජ බලවේගයක් වන කම්කරු පන්තියේ වර්ධනය මත එම වර්ධනය විසින් ඊට සරිලන ලෙස කෙරෙන බලපෑම ද ජාත්‍යන්තර මාක්ස්වාදී ව්‍යාපාරයේ ඓතිහාසික වර්ධනය තුල ඉහත සඳහන් වෛෂයික සමාජ-ආර්ථික ප්‍රවනතාවල වර්ධනය ප්‍රකාශනයක් අත්පත් කර ගත් දේශපාලන රූප ද අතර ප්‍රගාඪ අන්‍යොන්‍ය සම්බන්ධතාවයක් පැවතුනි.

1860 ගනන්වල ප්‍රථම ජාත්‍යන්තරය පිහිටුවා ලීම වනාහී ලෝක පරිමානව ධනේශ්වර කර්මාන්තයේ හා වෙලඳාමේ ප්‍රසාරනය මත ජාත්‍යන්තර කම්කරු පන්තියක් පැන නැගීම පිලිබඳ දේශපාලන පූර්වාපේක්ෂනය විය. මෙම සැබෑ ආර්ථික හා සමාජ සන්තතිය ඒ වන විට පැවති නොමේරූ රූප ප්‍රථම ජාත්‍යන්තරයේ ප්‍රයත්න පවත්වාගෙන යාමට නොසෑහුන හෙයින් එම ජාත්‍යන්තරය 1870 ගනන්වල මැද කාලයේ ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයෙන් ඉවත් විය. එහෙත් දශක දෙකකට අඩු කාලයක් ඇතුලත සිදුවූ බටහිර යුරෝපයේ හා උතුරු ඇමරිකාවේ කර්මාන්තවල අත්‍යසාමාන්‍ය වර්ධනය නව කාර්මික කම්කරු පන්තියක් වැඩී ඒම ද ස්වාධීන දේශපාලන සංවිධානයක් කරා එහි ගමන ද උත්තේජනය කලේ ය. ඒ සමගම, යටත්විජිත ක්‍රමයේ ප්‍රසාරනය ලෝකය පුරාම ජනතාව ජාත්‍යන්තර ධනේශ්වර සංවර්ධනයේ මහා සුලිය තුලට උකහා ගති.

1889 දෙවන ජාත්‍යන්තරය ආරම්භ කිරීම ධනවාදයේ වර්ධනයේ නව අවධිය ද එහි ප්‍රතිඵලයක් ලෙස නව කාර්මික කම්කරු පන්තියක සංඛ්‍යාව සහ එය දරන ආර්ථික අර්ථභාරයේ වර්ධනය ද පෙන්නුම් කලේ ය. මීලඟ වසර 25 තුල දෙවන ජාත්‍යන්තරයේ වර්ධනය ධනේශ්වර කර්මාන්තවල ප්‍රසාරනය සමග බැඳී තිබුනි. සන්තතිය සාරභූත වසයෙන් ජාත්‍යන්තර වූ අතර එය ප්‍රකාශනයක් අත් කර ගත් ප්‍රධාන ස්වරූපය වූයේ යෝධ ජාතික ආර්ථිකයන් වැඩී ඒම හා බලගතු ජාතික කම්කරු සංවිධාන පහලවීම ද වේ. සහතිකෙන්ම දෙවන ජාත්‍යන්තරය ජාත්‍යන්තර කම්කරු සහයෝගිතාවේ ඉදිරි දර්ශනය රැක-දරා සිටියේ ය. එහෙත් එහි ශාඛාවල ප්‍රායෝගික වැඩ ජාතික කර්මාන්ත පදනම තුල ගැඹුරෙන් මුල්බැස තුබුනි. 20වන ශතවර්ෂයේ දෙවන දශකයට ඇතුලුවත්ම, ලෝක ආර්ථිකයේ පීඩනය යටතේ ජාතික ආර්ථිකයන්හි ස්වෛරීත්වය බාදනය වීම අධිරාජ්‍යවාදී යුදවාදයේ වැඩී ආ ව්‍යසනය විසින් පිලිබිඹු කරන ලද තරම තක්සේරු කර ගැනීමට දෙවන ජාත්‍යන්තරය අසමත් විය.

පලමුවන ලෝක යුද්ධය පුපුරා යාම සමග දෙවන ජාත්‍යන්තරය බිඳ වැටීම ද තුන්වන ජාත්‍යන්තරය පැන නැගීම ද එම අතිමූලික වෙනසේ ප්‍රකාශනයක් විය. ට්‍රොට්ස්කි පැහැදිලි කල පරිදි :

''1914 අගෝස්තු 4 දින, සකල ජාතික ක්‍රියාමාර්ගයන්ගේ ම මල බෙරය සඳහටම හැඬුවිනි. කම්කරු පන්තියේ විප්ලවවාදී පක්ෂයට පදනම් වී ගත හැක්කේ ධනවාදයේ ඉහලම වර්ධනයේත් බිඳවැටීමේත් යුගය වූ වර්තමාන යුගයේ ස්වභාවයට ගැලපෙන්නාවූ ජාත්‍යන්තර ක්‍රියා මාර්ගයක් මත ම පමනි. ජාත්‍යන්තර කොමියුනිස්ට් ක්‍රියා මාර්ගයක් වනාහී කිසිසේත් ම ජාතික ක්‍රියාමාර්ගවල ඓක්‍ය සමස්තය හෝ ඒවායේ පොදු ලක්ෂන එකටෙක අමුනා තනාගත්තක් නො වේ. ජාත්‍යන්තර ක්‍රියාමාර්ගය ලෝක ආර්ථිකයේ තත්වයන් සහ කොන්දේසි ද ලෝක දේශපාලන පද්ධතිය එහි සියලු සම්බන්ධතාවන් සහ ප්‍රතිසතිතාවන් සහිතව එනම් එහි වෙන් වෙන් කොටස්වල අන්‍යොන්‍ය ප්‍රතිසතිත අන්තරා'ධීනතාවය සමග ද ගෙන කරන ලද විශ්ලේෂනයකින් සෘජුව පෙරට යා යුතු ව ඇත. වර්තමාන යුගයේ දී, අතීතයේදීට ද වඩා බෙහෙවින් වැඩි ප්‍රමානයකට, කම්කරු පන්තියේ ජාතික දිශාවනතිය ගලා ආ යුත්තේත්, ගලා ආ හැක්කේත් ලෝක දිශාවනතියකින් මිස ඊට ප්‍රතිලෝමව නො වේ.'' (*The Third International After Lenin,* ලෙනින්ගෙන් පසු තුන්වන ජාත්‍යන්තරය, ලන්ඩන් 1974, පිටු 3-4)

1928 ට්‍රොට්ස්කි මෙම වචන ලියා තබන කල්හි ම විප්ලවවාදී මූලෝපාය වර්ධනය කල යුතු වූ සාරභූත අත්තිවාරම ලෝක ආර්ථිකය වන්නේ ය යන සංකල්පය කොමියුනිස්ට් ජාත්‍යන්තරය තුල දරුනු ප්‍රහාරයකට ලක්ව පැවතුනි. තනි රටක සමාජවාදය පිලිබඳ ස්ටැලින්වාදී ක්‍රියාමාර්ගය 1917 ඔක්තෝබරයේ දී බොල්ෂෙවික් පක්ෂය බලය අල්ලා ගැනීමේ දී මූලෝපායික පදනම සපයා දුන් ජාත්‍යන්තරවාදයේ ප්‍රතිවිරුද්ධ අන්තය විය. සෝවියට් දේශයේ ජාතික ආර්ථිකයේ වර්ධනය රටක් තුල සමාජවාදී ව්‍යාපෘතියේ සාර්ථකත්වය පිලිබඳ ප්‍රාථමික සහ තීරනාත්මක නිර්නායකය ය යන ස්ටැලින්වාදී සංකල්පය වනාහී දෙවැනි ජාත්‍යන්තරය අරක්ගෙන පැවති ජාතිකවාදී දෘෂ්ටිය කරා ආපසු යාමක් නියෝජනය කිරීමකි. ස්ටැලින්ගේ ඉදිරිදර්ශනය කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ බොහෝ ශාඛාවල ප්‍රායෝගික වැඩ කටයුතුවල ආරම්භක ලක්ෂ්‍යය සම්පාදනය විය යුත්තේ එක්එක් සුවිශේෂ රට තුල කම්කරු පන්තිය මුහුන දී සිටුනා සමීප ජාතික කොන්දේසි වලින්ය යන ඔහුගේ සංකල්පය පොදුවේ දරාගත් නායකත්වයන් තුල ප්‍රතිචාරයක් අත් කර ගති.

ස්ටැලින්ගේ ජාතිකවාදී දිශානතිය ආරක්ෂා කලා පමනක් නොව එය න්‍යායිකව සහ දේශපාලනිකව යුක්ති සහගත කිරීමට ද ඉදිරිපත් වූවත් අතර අන්තෝනියෝ ග්‍රැම්ස්කි ද විය: ''සහතිකෙන්ම කීවොත්'' ඔහු කියා සිටියේ, ''වර්ධනයේ දිශාව ජාත්‍යන්තරවාදය දෙසට ය, එහෙත් ආරම්භක ලක්ෂ්‍යය 'ජාතික ය' - කෙනෙකු ආරම්භ කල යුත්තේ මෙම [ජාතික] ආරම්භක ලක්ෂ්‍යයෙනි.'' (*PrisonNotebooks*, සිරගේ සටහන් පොත්, (නිව් යෝක් 1971), 240 පිටුව.) මුසෝලිනීගේ පාලනයේ බිඳවැටීමෙන් පසු, ධනේශ්වරය ද ඉතාලි ධනපති ක්‍රමයද ගලවා ගෙන ඉහලම වර්ගයේ වාම ප්‍රතිසංස්කරනවාදී ජාතික පක්ෂයක් බවට විකාශනය වූ ඉතාලියේ කොමියුනිස්ට් පක්ෂයේ පසුකල ඉතිහාසයේ එලියෙන් ගත් කල්හි ග්‍රැම්ස්කිගේ ආස්ථානයේ දේශපාලන ගම්‍යයන් ඉතා විශදව පැහැදිලි වේ. ෆැසිස්ට්වාදීන්ගේ අත විඳි වධවේදනාවල ප්‍රතිඵලයක් ලෙස 1930 ගනන්වල දී මරනයට පත් ග්‍රැම්ස්කි පිලිබඳ මතකය ඉතාලි ස්ටැලින්වාදීන් විසින් වැලඳගනු ලැබීම ද තම න්‍යායික ආස්වාදය ලෙස ඔවුන් ඔහුට ගෞරව කිරීම ද පුදුමයක් නො වේ.

ලියොන් ට්‍රොට්ස්කි විසින් හතරවන ජාත්‍යන්තරය 1938 දී ආරම්භ කරන ලද්දේ තුන්වැනි ජාත්‍යන්තරයේ පරිහානියට ප්‍රතිචාර වසයෙනි. දෙවන ලෝක මහා යුද්ධය පුපුරායාම අතිශය බේදජනක ආකාරයකින් ලෝක ආර්ථිකයේ ද ලෝක දේශපාලනයේ ද ප්‍රමුඛත්වය ප්‍රදර්ශනය කලේ ය. කෙසේ වෙතත් පරස්වාචකව යුද්ධයෙන් පසු සමයේ බ්‍රෙට්න්වුඩ්ස් පදනමේ ධනවාදය පුනස්ථාපනය කිරීම ජාත්‍යන්තර කම්කරු ව්‍යාපාරය තුල ජාතික ප්‍රතිසංස්කරනවාදයේ ක්‍රියාමාර්ගය යලි පන ගැසීමකට තුඩු දුනි.

ලෝක වෙලඳාමේ අලුත් කෙරුනු ප්‍රසාරනය ජාතික ධනේශ්වර ආර්ථිකයන්ගේ දල ජාතික නිෂ්පාදිතයේ වර්ධනය සහ 1950 ගනන්වල හා 1960 ගනන්වල සෝවියට් සංගමය තුල ජීවන තත්වයන්ගේ අත්‍යසාමාන්‍ය වර්ධනය ස්ටැලින්වාදී සංවිධාන ඇතුලු ජාතික ප්‍රතිසංස්කරනවාදී පක්ෂයන්ට නව ආයුෂයක් ලබා දුනි. එහෙත් මෙම කාල පරිච්ඡේදය තුල දල ජාතික නිෂ්පාදනය කොතරම් ආවේගකාරී ලෙස ඉහල ගියත්, ජීවන තත්වයන් පවා ඉහල නැංගත්, එම කාල පරිච්ඡේදය වයෝවෘද්ධ ජාතික ප්‍රතිසංස්කරනවාදයේ දිග්ගැසුනේ වුවද අනිස්ථිර වූ තිරිහන් වීමකට වැඩිදෙයක් වූයේ නැත. යලි යලිත් ඇති වූ උද්ධමනය, අවපාතය, විරැකියාව ඉහල නැගීම, ලාභදායිත්වය ඇද වැටීම සහ (විශේෂයෙන්ම සලකුනු කරගත යුතු පරිදි එක්සත් ජනපදයේ සහ බ්‍රිතාන්‍යයේ දී) කම්කරු පන්තියට එරෙහි දුෂ්ට ප්‍රතිප්‍රහාරයක් එල්ලවීම විසින් අංග ලක්ෂිත වූ බ්‍රෙට්න්වුඩ්ස් පද්ධතියේ බිඳ වැටීම සහ දිග්ගැසුනා වූ ආර්ථික අර්බුදයක් පුපුරා යාම ජාතික ප්‍රතිසංස්කරනවාදය ප්‍රානශක්‍ය පිලිවෙතක් ලෙස මුලුමනින් ම බිඳ වැටීමට මග පෑදුවේ ය.

ජාත්‍යන්තර කමිටුව 1987 දී නව ජාත්‍යන්තර ඉදිරිදර්ශන යෝජනාව සැලසුම් කිරීම සඳහා සැලසුම් ආරම්භ කලේ ඉහත සඳහන් තතු තුල දී ය. මෙම සාකච්ඡාවේ ආරම්භයේ දී සිව්වන පුන්සැසියේ දී මතු කරන ලද ප්‍රශ්නයට පිලිතුරු දීමට ජාත්‍යන්තර කමිටුව, කොම්පියුටර් තාක්ෂනයේ වර්ධනය ද සංනිවේදනය හා ප්‍රවාහනයේ වඩා වේගවත් සහ අඩු වියදම් රූපයන්ගේ වර්ධනය ද උපයෝගි කොට ගෙන 1970 ගනන් සහ 1980 ගනන්වල දී පැන නැගි භූගෝලීකෘත ධනේශ්වර නිෂ්පාදනයේ නව ස්වරූපයන් පිලිබඳ අධ්‍යයනයකට සිය අවධානය යොමු කලේ ය. පාරජාතික සංගතයන් නිර්මානය කිරීම ධනේශ්වර නිෂ්පාදනයේ සහ මූල්‍ය සම්පාදනයේ නව ගුනාත්මක ඉදිරි ගමනක් නියෝජනය කලේ ය. ලෝක ආර්ථිකය සහ ධනවාදය ඓතිහාසිකව මුල් ඇද තිබෙන්නා වූ ද දේශපාලනයේ මූලික ඒකකය ලෙස පවතින්නා වූද ජාතික රාජ්‍ය පද්ධතිය අතර ඓතිහාසික ප්‍රතිසතිතාව ඉහත වර්ධනය විසින් පෙර නුවූ විරූ ලෙස තියුනු ආතතියකට ඔසොවා ලන ලදී.

මෙම අර්බුදයට විප්ලවවාදී විසඳුමක් සොයා ගත හැකි වන්නේ සමාජවාදී ජාත්‍යන්තරවාදය මත පදනම්ව පමනි, එනම්, ජාත්‍යන්තර කම්කරු පන්තිය දේශපාලනිකව සහ ප්‍රායෝගිකව එක්සත් කරලීම මගින් පමනි. කම්කරු පන්තියේ පවත්නා ජාතිකව-දිශාවනත වූ සංවිධාන සියල්ල - ස්ටැලින්වාදී හෝ ජාතික ප්‍රතිසංස්කරනවාදී හෝ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ - මෙම අර්බුදය විසඳීමට අසමත්වූහ. ඇත්තෙන්ම මෑත කාල පරිච්ඡේදය තුලදී ඔවුන් විසින් අත් කරගනු ලැබූ නිමක් නැති පරාජයන් මාලාව අනිවාර්යයෙන්ම ගලා ආවේ ජාත්‍යන්තර ධනේශ්වර සංවිධානයේ නව ස්වරූපයන් ඉදිරියේ, ඔවුන්ගේ ජාතික දිශානතිය විසින් ඇති කරන ලද දැඩි බෙලහීනතාව තුලිනි. ධනවාදයේ භූගෝලීය ඒකාග්‍රකරනය විසින් කම්කරු පන්තිය මුහුන දෙවා ඇති අභියෝගයට ගැලපුනේ ජාත්‍යන්තර කමිටුවේ ජාත්‍යන්තරවාදී ක්‍රියාමාර්ගය පමනි.

© www.wsws.org